මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

**මාධ්‍ය නිවේදන අංක :LAE/2025/01** **2025.03.03**

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025

## නාමයෝජනා භාර ගැනීම

ඉදිරියේ දී පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන 336ක (අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුනෙයි මහ නගර සභාව හා දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව, මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම ප්‍රාදේශීය සභාව, කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ පූනාකරි ප්‍රාදේශීය සභාව හා ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය ප්‍රාදේශිය සභාව හැර) එනම් මහ නගර සභා 28ක්, නගර සභා 36ක් හා ප්‍රාදේශීය සභා 272ක් සඳහා නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති, සභාපති, නියෝජ්‍ය සභාපති සහ සභිකයන් තෝරා පත් කරගැනීම සඳහා නාම යෝජනා භාර ගැනීමට අදාළ නිවේදන මේ වන විට අදාළ පළාත් පාලන ආයතනවල ප්‍රසිද්ධ කොට ඇත.

**ඒ අනුව ඡන්ද විමසීම සඳහා ඇප මුදල් තැන්පත් භාර ගැනීම 2025 මාර්තු මස 03 දින සිට 2025.03.19 දින මධ්‍යාහ්න 12.00 දක්වා ද (මෙම කාලය අතරතුර එළඹෙන 2025 මාර්තු 13 පෝය දින හා 2025 මාර්තු 08,09,15 හා 16 යන සෙනසුරාදා හා ඉරිදා දිනවල දී හැර) නාම යෝජනා භාර ගැනීම 2025 මාර්තු 17 දින සිට 2025 මාර්තු 19 දින දක්වා පෙ. ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා සහ 2025 මාර්තු 20 දින මධ්‍යාහ්න 12.00 දක්වා ද ඒ ඒ තේරීම්භාර නිලධාරී, දිස්ත්‍රික් ලේකම්/ දිසාපති කාර්යාලවල දී සිදු කරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.**

**ආර්.එම්.ඒ.එල්.රත්නායක**
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)